ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
(රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය)

INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA

# මහජනතාව වෙත කෙරෙන වැදගත් නිවේදනයයි

## ජංගම දුරකථන ජාල මගින් රක්ෂණ ඔප්පු අලෙවි කිරීම

රක්ෂණ ඔප්පුහිමියන් හෝ රක්ෂණයේ යෙදෙන මහජනතාව හෝ රක්ෂණය සම්බන්ධ බැඳියාවක් ඇති වෙනත් ඕනෑම අයෙකුට ජංගම/ස්ථාවර දුරකථන ජාල ක්‍රියාකරුවන් භාවිතා කර රක්ෂණ ඔප්පු විකිණීමට අදාලව පැමිණිලි/අදහස් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස මහජනතාවගෙන් මෙයින් ඉල්ලා සිටී.

මෙම කරුණු පිළිබඳව පැමිණිලි/අදහස්/තොරතුරු, ඔබව සම්බන්ධ කරගත හැකි තොරතුරු ද සහිතව, 2020 **ඔක්තෝබර් 14** දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑල/විද්‍යුත් තැපෑල/ෆැක්ස් මගින් පහත සඳහන් ලිපිනයේ **“සභාපති, ජංගම රක්ෂණ උප කමිටුව”** යන නමට ලබාදිය හැකි බව කරුණාවෙන් සලකන්න.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යනු 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත අධිකාරියක් වන අතර, එමගින් රක්ෂණ ඔප්පු හිමියන් හා අනාගත රක්ෂණ ඔප්පුහිමියන්ගේ බැඳියාවන් ආරක්ෂා කිරීමේ අරමුණෙන් රක්ෂණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට, අධීක්ෂණ කිරීමට හා නියාමනය කිරීමට පිහිටුවා ඇත.

*ඉහත කරුණු පිළිබඳව ඕනෑම පැහැදිලි කරගැනීමක් සඳහා වෙළඳපොළ සංවර්ධන හා බාහිර සම්බන්ධතා ඒකකයෙන් විමසන්න.*

සභාපති
ජංගම රක්ෂණ උපකමිටුව
**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**
11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
දුරකථන: (011) 2396184-9 ෆැක්ස් : (011) 2396190
ඊ මේල්: mosubcommittee@ircsl.gov.lk වෙබ් අඩවිය : www.ircsl.gov.lk